# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1654/15 – 2010 මැයි 20 වැනි බ්‍රහස්පතින්දා – 2010.05.20

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජීවන් කුමාරණතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහළගොඩ ගමේ පිහිටි ගාල්ල කොට්ඨාස භාර මැනුම් අධිකාරී විසින් 2008 සැප්තැම්බර් 13 වැනි දිනැතිව සකස් කර ඇති අංක ජීඒ/ඒකේඑම්/08/341 දරන පුගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති 'පුහුල්මුකලානහේන' නැමැති ප්‍රමාණයෙන් හෙක්. 0.0506ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

උතුරට: කන්දඋඩගේ පේමවතී හිමිකම් කියනු ලබන පුහුල්මුකලානහේන සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ග (ප්‍රා. ස.) සහ කන්දඋඩගේ ප්‍රේමවතී හිමිකම් කියන පුහුල්මුකලානහේන; දකුණට සහ බටහිරට: කන්දඋඩගේ ප්‍රේමවතී හිමිකම් කියන පුහුල්මුකලානහේන.

ජීවන් කුමාරණතුංග,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

යොමු අංකය: එල්ඩී/05/2008/ඩබ්එස්/27.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රා.ලේ./අක්/5/1/393/viii.
2009 ජූනි මස 10 වැනි දින,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 62

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුභ සාධන අමාත්‍ය, ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්මලාන ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක පී.පී.කො. 9011 හා 2009 අගෝස්තු 07 දිනැති මූලික පිඹුරෙහි ප්‍රමාණයෙන් හෙක්. 0.0066ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත වූ අංක 11, 17 සහ 20 යන ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 11 – දෙල්ගහවත්ත පාරේ, වරි. අංක 444/20 – ප්‍රමාණය: හෙක්. 0.0002**

උතුරට: ආර්. ඒ. ලයනල් හිමිකම් කියන දෙල්ගහවත්ත පාරේ, වරි. අංක 444/21 සහ ලිලියන් හෙට්ටිආරච්චි හිමිකම් කියන දෙල්ගහවත්ත පාරේ වරි. අංක 444/20; නැගෙනහිරට: කැබලි අංක 10 සහ 12; දකුණට: කැබලි අංක 12 සහ 19; බටහිරට: කැබලි අංක 20.

02. **කැබලි අංක 17 – රජ මාවත පාරේ, වරි. අංක නොදන්නා විද්‍යාරාම පන්සල – ප්‍රමාණය: හෙක්. 0.0057**

උතුරට: කැබලි අංක 18 සහ 16; නැගෙනහිරට: කේ. ගුණාලංකාර ස්ථවිර

හිමිකම් කියන, රජ මාවත පාරේ වරි. අංක සඳහන් නොවන විද්‍යාරාම පන්සල; දකුණට: කේ. ගුණාලංකාර ස්ථවිර හිමිකම් කියන, රජ මාවත පාරේ වරි. අංකයක් සඳහන් නොවන කැබලි අංක 31 සහ 18; බටහිරට: කැබලි අංක 18.

03. **කැබලි අංක 20 – දෙල්ගහවත්ත පාරේ, වරි. අංක 444/21 – ප්‍රමාණය: හෙක්. 0.0007**

උතුරට: ආර්. ඒ. ලයනල් හිමිකම් කියන දෙල්ගහවත්ත පාරේ, වරි. අංක 444/21; නැගෙනහිරට: ලිලියන් හෙට්ටිආරච්චි හිමිකම් කියන දෙල්ගහවත්ත පාරේ වරි. අංක 444/20, කැබලි අංක 11 සහ 12; දකුණට: කැබලි අංක 19 සහ 21; බටහිරට: ආර්. ඒ. ලයනල් හිමිකම් කියන දෙල්ගහවත්ත පාරේ, වරි. අංක 444/21 සහ කැබලි අංක 21.

ජොන්ස්ටන් ක්ෂේවියර් ප්‍රනාන්දු,
ඉඩම් හා ඉඩම් සංවර්ධන,
ජනාවාස හා රණවිරු සුබසාධන
අමාත්‍ය.

ගොනු අංකය: එල්ඩී/05/2008/යූඩී/425(එල්යූ).
ලුනාව ව්‍යාපෘතියේ අංකය: එල්ආර්අයි-සීඩීපී/එස්ඩී/ආර්/එන්-1-1-4.
2010 මාර්තු මස 01 වන දින,
"ගොවිජන මන්දිරය",
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 79

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.